PR/2018/26/S


# ජපන් තානාපති කාර්යාලය

නො 20, ශ්‍රීමත් ආර්.ජී.සේනානායක මාවත, කොළඹ 7, ශ්‍රී ලංකාව

දු.ක :94-11-269-3831~3, ෆැක්ස් 94-11-269-8629

ඊ මේල්: cultujpn@sltnet.lk


සැප්තැම්බර් 01 2018

## පුවත්පත් නිවේදනය

## 2018 ජපන් විදේශ අමාත්‍යවරයාගේ සම්මානය මහාචාර්ය කමලා ලියනගේ වෙත

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ මහාචාර්ය කමලා ලියනගේ වෙත ජපන් විදේශ අමාත්‍ය වරයාගේ සම්මානය පිරිනැමීම ශ්‍රී ලංකාවේ ජපන් තානාපති කෙනිචි සුගනුමා මැතිතුමා අතින් 2018, අගෝස්තු 31 වන දින මහනුවර අර්ල්ස් රීජන්ට් හෝටල් පරිශ්‍රයේදී උත්සවශ්‍රීයෙන් සිදු කෙරිණි.

ශ්‍රී ලංකාවේ දේශපාලන විද්‍යා අධ්‍යයන ක්ෂේත්‍රයේ විද්‍යාර්ථියකු වන මහාචාර්ය කමලා ලියනගේ නූතන ජපන් දේශපාලන විද්‍යාවේ ප්‍රවීණයෙකි. ඇය වසර 1985 දී ජපන් රජයේ ශිෂ්‍යත්වලාභියකු ලෙස ටෝකියෝ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපනය ලැබීය. ඉන් අනතුරුව තම මවුරට බලා පැමිණ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ නූතන ජපන් දේශපාලන විද්‍යාව ඉගැන්වීමෙහි නිරත වූවාය. ජපන් අධ්‍යයන මෙරට විද්වතුන් අතර ප්‍රචලිත වීමට මෙම මෙහෙවර ඉහළ පිටුවහලක් දැරීය.

වසර 2013 දී පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ශ්‍රී ලංකා - ජපන් අධ්‍යයන කේන්ද්‍රය ස්ථාපනය කිරීමේදී එහි ප්‍රාරම්භක සමාජිකාවක වශයෙන් ඉහළ දායකත්වයක් ලබා දුන්නාය. ඇය විසින් අධ්‍යයන කේන්ද්‍රයට ලබාදුන් නායකත්වය හා දායකත්වය ඔස්සේ වාර්ෂිකව පැවැත්වෙන ශ්‍රී ලංකා- ජපන් සහයෝගිතා පර්යේෂණ සමුළුව වඩාත් කැපීපෙනෙන ජපානය සහ ශ්‍රී ලංකාව අතර අධ්‍යයන හුවමාරු වේදිකාවක් ලෙස ස්ථාපිත විය.

ජපානයේ විදේශ කටයුතු අමාත්‍යාංශයේ සිංහල භාෂා විශේෂඥයන් බොහෝ දෙනෙකුම පේරාදෙණිය විශ්ව විද්‍යාලයේදී අධ්‍යාපනය ලැබීය. එවන් අවස්ථාවන් වලදී ඔවුන් මහනුවර රැදී සිටින කාලසීමාවේදී තම ස්වේච්ඡා සහයෝගය ලබාදීමට මහාචාර්ය ලියනගේ කටයුතු කලාය.

දීර්ඝ කාලයක් තිස්සේ ශ්‍රී ලංකාව තුල ජපන් පර්යේෂණ සහ ජපන්- ශ්‍රී ලංකා මිත්‍රත්වය ප්‍රවර්ධනය කිරීමට කෘතවේදීත්වය පලකිරීමක් වශයෙන් මෙම සම්මානය මහාචාර්ය ලියනගේ වෙත පිරිනැමේ.

විදේශ අමාත්‍යවරයාගේ සම්මානය පිරිනැමෙන්නේ ජපානය සහ අනෙකුත් රටවල් අතර මිත්‍රත්වය ප්‍රවර්ධනය කිරීම ඇගයීමක් වශයෙන්, අන්තර්ජාතික ක්ෂේත්‍රයේදී විශිෂ්ට හැකියාවන් සහ දායකත්වයන් දැක්වූ පුද්ගලයින් සහ කණ්ඩායම් වෙතයි.

*************************************************************

වැඩි විස්තර සදහා සංස්කෘතික අංශය අමතන්න

දු.ක :94-11-269-3831~3 ( දිගුව- 258)